*2017 අගෝස්තු මස 28 සඳුදා දින*
*2017 ஆகஸ்ட் மாதம் 28 ஆம் திகதி திங்கட்கிழமை* **Monday**
***28 th August** 2017*

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.11.43 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 11.43 மணிக்கு சபைக் கூடியது.

The Council met at 11.43 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------------

සුභ උදෑසනක් සියළු දෙනාටම. අද දිනට න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ගරු අමාත්‍යතුමන්ලා ,ඒවගේම විපක්ෂනායකතුමා ,ඒවගේම ගරු මන්ත්‍රීතුමිය හා මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. අද දිනට න්‍යායපත්‍රානුකූලව පළමුව තිබෙන්නේ ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම්:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ :**

කිසිවක් නැහැ.

**ගරු සභාපතිතුමාගේ නිවේදන :**

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව සභාවට ප්‍රකාශය ඉදිරිපත් කිරීම.

අතිගරු ජනාධිපතිතුමන් විසින් ගරු ආණ්ඩුකාරතුමන් වෙත එවන ලද නිවේදනය ගරු බී.එම්.ඒ.ආර්.පෙරේරා මැතිතුමා ආණ්ඩුකාරවර ,සබරගමු පළාත, ගරු ආණ්ඩුකාරතුමනි, ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ,ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ ව්‍යවස්ථාවේ (2) අනු ව්‍යවස්ථාව යටතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතෙහි පිටපත් භාෂාත්‍රයෙන් මේ සමඟ ඔබ වෙත එවමි.

මෙම පනත් කෙටුම්පත පිළිබඳව ඔබ පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශයන් මෙම ලිපිය ලැබී දින 14 ක් ඇතුළත මා වෙත ලැබීමට සළස්වන මෙන් කරුණාවෙන් දන්වමි.

මෙයට - හිතවත්,

මෛත්‍රීපාල සිරිසේන,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන්.

2017 අගෝස්තු මස 17 වෙනි දින.

එම ලිපිය සහ ආණ්ඩුකාරතුමා සභාවට යොමු කරමින් එවන ලද ලිපියේ පිටපත් මේ වනවිටත් ගරු මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමිය වෙත මේ වනවිට ලැබෙන්නට සළස්වා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සබරගමුව පළාත් සභාවේ අදහස් හා ප්‍රකාශයන් ලබා ගැනීම සඳහා සභා න්‍යාය පත්‍රයේ අංක 14 යටතේ පළාත් සභාවේ පොදු කටයුතු යටතේ අවස්ථාව ලබා දීමට කටයුතු කරනවා.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

*ගරු ආ.ප.සංවිධායක හර්ෂ සියඹලාපිටිය මැතිතුම*
*கௌரவ அரச.க.அமைப்பாளர் ஹர்ஷ சியம்பலாபிடிய*
*Hon.Gov.Whip Harsha Siyambalapitiya*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ප්‍රභාත් ද අල්විස් මන්ත්‍රීතුමා අද නිවාඩු ඉල්ලලා තියනවා. ඒ අනුව නිවාඩු ලබාදෙන ලෙස යෝජනා කරනවා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් මැතිතුමා*
*கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

එම යෝජනාව ස්ථිර කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------

ස්තුතියි ! ගරු මන්ත්‍රීතුමා වෙත මෙම ගරු සභාවේ නිවාඩු ලබාදීම අනුමත කරනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම :** නැත

**කාරක සභා වාර්තා පිළිගැන්වීම :** නැත

**පෙත්සම් :** නැත

**ප්‍රශ්න :** නැත

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ :** නැත

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------

මේ යටතේ ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා*
*கௌரவ உறுப்பினர் அஜித் குமார மெத்தேகம*
*Hon.Member Ajith Kumara Meddegama*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, සීමාසහිත අටකලම්පන්න විවිධ සේවා සමූපකාර සමිතියේ නිළවරණය මේ දිනවල පැවැත්වෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු ප්‍රධාන ඇමතිතුමා දැනුවත් කරමින් ලිපියක් සභාගත කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි! මීළඟට කේ.එල්.රත්නායක මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක මැතිතුමා*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member K.L.Ratnayake*
----------------------------------------------------

ගරු සභාපතිතුමනි, ගිය වර්ෂයේ දී ඇරැපොල විද්‍යාලය සහ විද්‍යාල 11 කට ප්‍රාථමික අංශයේ පන්ති වැඩි කිරීමක් සිදුවුනා. ඒකෙදී 2017 වර්ෂයට පමණයි කියන කාරණාව විදුහල්පතිතුමන්ලා විසින් ප්‍රකාශ කරනවා. හැබැයි මේකෙදී කුමර විද්‍යාලයට එක නිර්නායකයකුත් අනෙක් පාසැල්වලට තවත් නිර්නායකයකුත් තමයි තිබෙන්නේ. කුමර විද්‍යාලයේ නිර්නායකය 2017 ජනවාරි මස පන්ති ආරම්භ කිරීමෙන් අනතුරුව අවශ්‍යතාවය මත අතිරේක පන්තියක් ආරම්භ කිරීමේ පදනම මත අතිරේක එක් පන්තියක් ආරම්භ කිරීම. ඒ නිසා ගරු සභාපතිතුමනි, විෂයභාර ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා වැඩි කරපු පන්තිය ඉදිරි වර්ෂවලටත් එම වැඩි කරපු පන්තිය බලපවත්වන ලෙස ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු කේ.එල්.රත්නායක මන්ත්‍රීතුමනි.

**ශෝක ප්‍රකාශ යෝජනා :** නැත

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා :** නැත

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා :**

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

1 කොලොන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ බදු අයකර ගැනීම පිළිබඳ අදාළ තොරතුරු හා වාර්තා

ලබා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභාගත කිරීම.

2 කොලොන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කැලි කසළ ඉවත් කිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභාගත කිරීම.

3 කොලොන්න ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලය විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභාගත කිරීම.

මෙම අතුරු ව්‍යවස්ථාව සභාගත කිරීම සඳහා ගරු ප්‍රධාන ඇමතිතුමාට ආරාධනා කරනවා.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*

-------------------------------------------

ගරු සභාපතිතුමනි,

1 කොලොන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ බදු අයකර ගැනීම පිළිබඳ අදාළ තොරතුරු හා වාර්තා ලබා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභාගත කිරීම.

2 කොලොන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කැලි කසළ ඉවත් කිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභාගත කිරීම.

3 කොලොන්න ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලය විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභාගත කිරීම.

යන අතුරු ව්‍යවස්ථා මේ අවස්ථාවේ දී ගරු සභාපතිතුමනි, මම සභාගත කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. ඔබතුමා විසින් සභාගත කරන ලද ඒ සියළුම අතුරු ව්‍යවස්ථාවන් ප්‍රඥප්ති කාරක සභාවට යොමු කිරීම සඳහා, ඒ වගේම ප්‍රධාන අමාත්‍යාංශ උපදේශක කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කරනවා.

**පළාත් සභාවේ පොදු කටයුතු :**

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව සාකච්ඡා කිරීම සහ අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාව. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව ලබාදෙනවා.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*
*-------------------------------------------*

ගරු සභාපතිතුමනි, 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මෙම කෙටුම්පත සම්බන්ධයෙන් අද සභාවට ඉදිරිපත් කර තිබෙන අතරවාරයේ දී ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා අද උදෑසන වාචිකව මේ සම්බන්ධයෙන් මට කරුණු කීපයක් ඉදිරිපත් කරමින් එතුමා කිව්වා මෙයට සංශෝධන කීපයක් ඉදිරියේ දී ගැසට් කරන්නට එතුමා බලාපොරොත්තු වෙනවා. ඒ තුළින් කාලය දීර්ඝ කිරීම සහ ඒ වගේම ඡන්ද එකවර තැබීමේ යෝජනා පමණක් ඇතුළත් කර මෙම ගැසට් නිවේදනය ඉතා ඉක්මණින් ඉදිරිපත් කරන හෙයින් එම ගැසට් නිවේදනය ඉදිරිපත් කිරීමෙන් පසු මෙම පනත අප සභාවේ අනුමත කර එවන ලෙස අතිගරු ජනාධිපතිතුමා මා වෙත වාචිකව දැන්වීමක් කළා. මම මේ අවස්ථාව අපේ ගරු ආණ්ඩුකාරතුමාට දැනුම් දුන්නා. මොකද එතුමාගේ නිවේදනයක් අනුව තමයි ඔබතුමා අද මේ කාර්යය ඉදිරිපත් කරලා තියෙන්නේ. එතුමාත් මා දන්නා තරමින් අතිගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරන්න ඇති කියලා මා හිතනවා. ඒ අනුව මෙම ගරු සභාව වෙත මම අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීම අනුව මෙම යෝජනාව නිසි පරිදි සංශෝධනය වීමෙන් මෙම සභාවට ඉදිරිපත් කරලා අනුමත කර ගැනීම සඳහා අපගේ විරුද්ධත්වයක් නැති බව මම මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරමින්, මෙම දිනය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
*----------------------------------------------------------*

ස්තුතියි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මේ පිළිබඳව..........

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
*---------------------------------------------------------*

ගරු සභාපතිතුමනි, අපට මේ ලිපිය ලැබුනේ මේ 23 වෙනිදා එවපු ලිපිය අපට ලැබුනේ ඔබතුමා හරහා මේ ලිපිය එවලා තියෙන්නේ ආණ්ඩුකාරතුමාගේ උපදෙස්මත. මේ ලිපිය අනුව අපි කවුරුත් සූදානම් වුනා, මේ 20 වෙනි ව්‍යවස්ථා සංශෝධනය අනුමත කරන්න. අපි මේක අනුමත කරගන්න ඕන. ගරු ජනාධිපතිතුමා සමඟ ගරු අග්‍රාමාත්‍යතුමා සාකච්ඡා කරලා තමයි අපට ගරු අග්‍රාමාත්‍යතුමා උපදෙස් දුන්නේ මේ පනතට අනුමැතිය දෙන්න කියලා. අපි සූදානමින් ඉන්නවා. දැන් අපට කල්දාන්න බෑ. අපි මේ සභාවේ දී අද සාකච්ඡාවට අරගෙන එය අද සාකච්ඡාවට නොගන්නවා නම් ඡන්ද විමසුමකට ඉදිරිපත් වෙලා සංශෝධනයක් තියනවා නම් සංශෝධනවලට යටත්ව අපි කටයුතු කරන්න සූදානම් කියන එක ඔබතුමාට දැනුම් දෙනවා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------------

ගරු විපක්ෂනායකතුමනි,

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ මැතිතුමා*
*கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த* *Hon. Minister Athula Kumara Rahubadda*
---------------------------------------------------------------

ගරු සභාපතිතුමනි,ඡන්දයකට යනවා නම් අපෙත් සංශෝධන තියනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විදිහට මැතිවරණ ක්‍රමය එකම දිනයක පවත්වන එක පිළිබඳව අපේ කිසි ගැටළුවක් නෑ. ඒ වගේම ප්‍රධාන ඇමතිතුමාගේ බලතල කුමන ආකාරයකින්වත් පාර්ලිමේන්තුව සතු කර ගන්නවාට අපි විරුද්ධයි. ඒකට අපේ සංශෝධනයක් තියනවා. ඒ වගේම මැතිවරණ ක්‍රමය සංශෝධනයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විදිහට අපේ මතවාදයක් තිබුණා. අපේ එකඟතාවයක් තිබුණා. ඒ වගේම දැනට තියන පළාත් සභාව ඉදිරියට සභිකයොත් එක්ක දික් කරනවාට, මොකද අපේ ධූර කාලය වසර හතර හමාරක් අහිමිවෙලා තියනවා, හතර වෙනි පළාත් සභාවේ අපි, තුන්වෙනි පළාත් සභාවේ ඉදලා. ඒ නිසා ඒ ධූර හතර තුළ අපේ කාල සීමාව වසරක සභාවක කාල සීමාවක් ඉකුත් වෙලා තියනවා. ඒ නිසා සභික ධූරත් එක්ක සභාව දික් කරනවාට අපේ එකඟතාවය තියනවා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------------

ස්තුතියි ! ගරු අමාත්‍යතුමනි. ගරු විපක්ෂනායකතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් කරන ලද ප්‍රකාශය මා වෙත පෞද්ගලිකවත් ගරු ආණ්ඩුකාරතුමා, එතුමා රත්නපුරෙන් බැහැරව ඉන්නේ. එතුමා මා වෙත දුරකථනයෙන් දැනුම් දුන්නා. එතුමා මේ පිළිබඳව එතුමාගේ ප්‍රකාශය මේ ආකාරයට කටයුතු කළයුතුයි කියන එක එතුමා මට දුරකථනයෙන් දැනුම් දුන්නා. එතුමා ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා සිටියා. ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත තමයි මම ගරු සභාව කැඳවීමේ කටයුත්ත කළේ.

ඒ වගේම ගරු ආණ්ඩුකාර තුමාගෙන් උපදෙස් ලැබුණා මට ගරු ප්‍රධාන ඇමතිතුමා කිව්වා වගේ මේ පනත සංශෝධන සහිතව නැවත ඉදිරිපත් වෙනවා. ඒ අනුව ඒ කැඳවන දිනයකට මේ කටයුත්ත කරන්න කියලා ගරු ආණ්ඩුකාරතුමා මට උපදෙස් ලබාදුන්නා. ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබුණු උපදෙස් අනුව, ඒ වගේම මේ වෙලාවේ ගරු ආණ්ඩුකාරතුමා ලිපියක් එවා තිබෙනවා. මාෂල් පෙරේරා, ගරු ආණ්ඩුකාරවර, එතුමා කරපු ප්‍රකාශය.

සබරගමුව පළාත් සභාව,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 20 වන සංශෝධන කෙටුම්පත පිළිබඳ විවාදය හා බැඳේ. අද දින, එනම් 2017.08.28 වැනි

දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 20 වන සංශෝධනය මේ කෙටුම්පත පිළිබඳව සභාවේ විවාදයට නියමකර තිබුණි. එහෙත් අතිගරු ජනාධිපතිතුමාගේ කාර්යාලයෙන් මට ද, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ද ලැබී ඇති පණිවිඩය අනුව ඉහත කී 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතට සංශෝධන කීපයක් ඇතුළත් කිරීමට ඇති බව දන්වා ඇති බැවින් එම විවාදය සඳහා සුදුසු දිනයක් නියම කර ගන්නා මෙන් ද ඒ අනුව විවාදය කල් තබන මෙන් ද මෙයින් දැනුම් දෙමි. ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමා ලිපියකින් දැනුම් දීලා තියනවා. ඒ අනුව සභාව කල් තැබීමේ නිවේදනය ගරු සභානායකතුමා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
------------------------------------------------------------

පොඩ්ඩක් ඉන්න. ගරු සභාපතිතුමනි ඔබතුමාට ලිපියක් ආවට අපිට ඒක පෙන්වන්න ඕනේ. අපිට ඒක දෙන්න. අපි ඊට පස්සේ තීන්දුවකට බහිමු.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

නැහැ. සභාව කැඳවීමේ නියෝගය මට ලැබිලා තියෙන්නේ .

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
------------------------------------------------------------

විශේෂයෙන් මෙතෙන්දී කියන්නට ඕනේ ගරු සභාපතිතුමනි තමුන්නාන්සේලා කතා කරන කොට මම කතා කළා ගරු ආණ්ඩුකාරතුමාත් එක්ක. ආණ්ඩුකාරතුමා කිව්වා ජනාධිපතිතුමා මේකට අනුමැතිය ඉල්ලලා තියෙන්නේ ඔබතුමන්ලාගේ ප්‍රශ්නයක් තියෙනවද කියලා. මම කිව්වා නෑ අපි පක්ෂව දෙනවා. අපි සහයෝගය දෙනවා. එහෙම නම් ප්‍රශ්නයක් නැනේ කියලා කිව්වා. ඊට පස්සේ ඔබතුමා ගාවට කැඳවීමක් කළා. මම ආවට පස්සේ ඔබතුමන්ලා කතා කළා ගරු ආණ්ඩුකාරතුමා එක්ක. එතනදී මම ඉල්ලුවා ඔබතුමන්ලාට එතුමාගේ ලිඛිතව ලිපියක් දෙන්න කියලා. ඒ ලිඛිත ලිපිය අපිට ඉදිරිපත් කරන්න. ඒක විශ්වාසයට ගත්තොත් අපි පිළිගන්නම් .

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

විපක්ෂනායකතුමා සභාව කැඳවීමේ ලිපිය නිකුත් කරලා තියෙන්නේ මට. සභාපතිවරයා හැටියට. සභාව මම කැඳවූවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදනය යටතේ. එතකොට ගරු ආණ්ඩුකාරතුමා නිවේදනයක් නිකුත් කරලා තියෙනවා දූරකථනයෙනුත් දැනුම්දීලා තියෙනවා. ඔබතුමාට දැනුම් දුන්නා වගේම. මට සභාව කල් තැබීමේ කටයුත්ත කරන්න කියලා. ඒ අනුව අපි

සභාව කල් තැබීමේ කටයුත්ත කරනවා. අපිට ඒ ගැන සාකච්ඡා කරන්න කල් තියෙනවා. ගැටළුවක් නෑ.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි ඔබතුමා සඳහන් කරන පරිදි මෙම ගරු සභාව 2017 සැප්තැම්බර් මස 12 වෙනිදින පෙරවරු 10.00 දක්වා කල් තැබීමට යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------

ස්තූතියි ගරු සභානායකතුමනි. දැන් වේලාව පෙරවරු 11.55 යි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් වෙනවා. මෙම ගරු සභාව 2017 ක්වූ සැප්තැම්බර් මස 12 වෙනිදින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අත්/කළේ :

කංචන ජයරත්න
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 ක් වූ අගෝස්තු මස 31 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.

(අශෝධිත පිටපත)